055293
ML/PR
2017/09/08

# දුම්බර පිටියේ බණ්ඩාර දෙවියෝ


| | |
|---|---|
| අපේක්ෂකයාගේ නම | : හිමාලි ගමගේ |
| විභාග අංකය | : DD/MA/DA/08/016 |
| උපාධි පාඨමාලා | : ශාස්ත්‍රපති (MA) එක් අවුරුදු උපාධි පාඨමාලාව |
| අධ්‍යයන වර්ෂය | : 2008/2009 |


055293

# 01 වන පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

අතීතයේ සමාජයේ ජීවත් වූ ජනයා ස්වභාවධර්මය විසින් ලබා දෙනු ලැබූ දායාද මෙන් ම එමඟින් ඔවුන්හට අත්විඳීමට සිදු වන්නා වූ දුක් කරදර ද නිසා එකී වස්තූන් කෙරෙහි ගෞරවයෙන් බැලීමත් ඒ සඳහා විවිධ පුද පූජාවන් පැවැත්වීමත් සිදු කළහ.

තමන්ට නොපෙනෙන මෙකී වස්තූන් උදෙසා පුද සත්කාර කර කන්නලව් කිරීම තුළින් තම තමන්ගේ සිතැඟි අරමුණු මල් ඵල ගැන්වෙන බවක් දැඩි සෙ විශ්වාස කළ ගැමියා එහි දි ගස්, ගල්, පර්වතවලට අරක්ගත් දේව පිරිස් කොට්ඨාසයක් සිටින බව ද විශ්වාස කළේ ය. මියගිය ඥාති මිත්‍රාදීන් හා පිට දේශවලින් පැමිණි සාංක්‍රමණිකයන් ද මෙකී තෙද බල පෙන්වන බව ඔවුන්ගේ මතයයි. එනිසා ඔවුහු සමාජයට දියුණු වූ ජනයා ශිෂ්ට සම්පන්න වෙත් ම එකී විශ්වාස මුසු කර ගනිමින් දේවතාවුන් ගැන කතා පුවත් නිර්මාණය කර ගත්හ.

තමන් හට උදව්වක් උපකාරයක් කළ කවරෙකු හට වුව ද පෙරළා ප්‍රතිඋපකාරයක් කිරීමට පුරුදු වූ ගැමියා තමන්ට පිහිට වන්නා වූ නොපෙනෙන දෙවියන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීමට අමතක නොකළේ ය. එලෙස ඔවුන් අදහන දෙවියන් මුල් කොටගෙන සිදු කරන පූජා විධි හා වත් පිළිවෙත් අදටත් දක්නට ලැබේ.

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ ඇදහූ පිටියේ බංඩාර දෙවියන් යනු ඒ අතුරින් සුවිශේෂ දෙවියෙකි. එම දෙවියන් මුල් කොට ගනිමින් පිටියේ දේවාලයේ ආරම්භය, එහි දි සිදු කරන්නා වූ පූජා විධි රටාවන්, මිනිසුන් ඒ පිළිබඳ ව පළ කරන්නා වූ මතිමතාන්තර ඉදිරිපත් කිරීමට මෙමගින් අපේක්ෂා කරන අතර එකී දේවාල හා බැඳි පවතින්නා වූ සුවිශේෂ උත්සව මාලාවන් පිළිබඳ ව ද විශ්ලේෂණය කරමින්, පිටියේ දෙවියන් ඇතළු දේව සංකල්පය කෙරෙහි සමස්ත ලාංකීය ජනයා වෙතින් නිරූපණය වන වර්තමාන තත්ත්වය පිළිබඳ ව පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම ද මාගේ අපේක්ෂාවයි.